# ඉලි සහ ඉෆිගේ යාළු කම



මන්දුලී වික්‍රමආරච්චි

**කෘතියේ නම:** ඉලී සහ ඉෆී ගේ යාළුකම

**කතෘගේ නම:** මන්දුලී වික්‍රමආරච්චි

කතෘ ප්‍රකාශනයකි

**කතෘගේ වෙනත් කෘති:** අකීකරු දුව
හිත හොඳ සිංහ පැටියා.

**කෘතිය පළ කරන දින:** 2026 අප්‍රේල් 26

ISBN: **978-624-211-138-4**

# පිදුම

දයාබරත්වයෙන් මා හට ඔවදන් දී

දැනුම රැස් කොට

මා දිරි ගැන්වූ

පියාණන්ටත්

දයාබර ගුරු  මෑණියන්ට

සහ

නන් අයුරින් උපකාර කල සැමට

මෙම පොත පුදමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් ඇයේ දරුවන් ගත්කතුවරුන් ලෙස ඇයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.

මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

**ශශිකලා සේනාධීර**

**විදුහල්පතිනිය මහාමායා බාලිකා විද්‍යාලය**

මන්දූලි වික්‍රමආරච්චි

7 ශ්‍රේණිය C

මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# <u>ඉලි සහ ඉෆිගේ යාළු කම</u>

ඒකෝමත් එක දවසක පුංචි කුමාරිකාවක් එයාගේ අම්මයි තාත්තයි එක්ක ජීවත් වුණා.එයාලා හරිම ආදරයෙන් තමයි ජීවත් වුනේ.මේ කුමාරිකාවගේ නම තමයි ඉලි. ඒ වුණාට එයාගේ අම්මට අසනීපයක් හැදිලා එයාට නොයකුත් වෛද්‍යවරුන් කැදව්වත් ඇයගේ රෝගය තව තවත් උත්සන්න වුණා.



රජතුමා ඉන් පසු තම රාජධානියට පැවසුවා කවුරු හරි කෙනෙක් රැජිනව සනීප කර දුන්නොත් රන් කාසි 100 ක් පිරිනමන බවට පොරොන්දු වුනා. ඒත් කිසිම කෙනෙකුට රැජිනව සුව කරන්න බැරි වුණා.ඊට පස්සේ එයාගේ අම්මා ජීවිතයෙන් සමුගත්තා. ඉලියි එයාගේ තාත්තයි ගොඩාක් දුක්වුණා. ඊට පස්සේ ඉලී හැම තිස්සේම අම්මා ගැන හිතුවා.

ඊට පස්සේ ඉලීගේ තාත්තා එයාට කුඩම්මා කෙනෙක් ගෙනාවා. ඒ කුඩම්මාටත් ඉලීගේ වයසේම තවත් දුවෙක් හිටියා. එයාගේ නම තමයි ඉෆි.

ඉරියි ඉලියි ටික දවසකින් යාලු උනා. ඒ දෙන්නා හැම වෙලේම එකට හිටියේ. ඒ දෙන්නා හොදම යාළුවෝ වුණා. ඒ දෙන්නා හැම දෙයක්ම බෙදා හදා ගත්තා. ඒ වුනාට ඉරිගේ කුඩම්මා ඉලිට කැමති නෑ. ඉරිගේ අම්මා කැමති ඉරි රජතුමාගෙන් ඊළගට රජ කම බාර දෙන්න. ඒත් ඒකට රජතුමා කැමති වුනේ නෑ. ඉරිගේ අම්මට ගොඩාක් තරහා ගියා ඒක අහලා. ටික දවසක් ගියාට පස්සේ රජතුමාට පණිවිඩයක් ආවා එහා රාජධානියෙන් යුද්ධයකට

අරාධනා කරලා තිබුණා. ඉතින් රජතුමාට මේකට යන්නම වෙනවා. නැත්තම් රජතුමාගේ රාජධානියට කුමක් හෝ සිදු වුවහොත් ඒ නිසා රජතුමාට යන්නම වෙනවා. මේ ගැන රජතුමා එයාගේ පවුලට හා රාජධානියට පැවසුවා.ඊට පස්සේ ඉලි ඇවිත් අඩ අඩා කිව්වා අනේ තාත්තේ ඔබට යන්නම ඕනෙද අනේ යන්න එපා කියලා කිව්වා. ඊට පස්සේ ඉෆිගේ අම්මා කිව්වා නෑ නෑ ඔයා යන්න ඊට පස්සේ රජතුමා යුද්දෙට ගියා. ටික දවසකට පස්සේ ඉලීටයි ඉෆීටයි එයාගේ අම්මටයි පණිවිඩයක් ආවා රජතුමා මියගොස් බව.

ඉලී හොදටම දුක්වුණා. ඉෆිත් දුක් වුණා. ඒත් ඉෆිගේ අම්මා සතුටු වුණා. පස්සේ ඉලීට ගොඩාක් වෙනස්කම් වලට මුහුණ දෙන්න සිද්ධ වුණා. එයාට ගොඩාක් දුකයි.



එයාට කවදාවත් නොකරපු වැඩ ඉලීට කරන්න සිදුවුණා. ඒත් එයා කාටවත් වෛර කරේ නෑ . මාලිගාවේ සහ රාජධානියේ රජකම ඉෆිට ලැබුණා. ඒත් ඉෆී කොහොමත් අම්මාගේ වැඩවලට කැමති වුනේ නැහැ. ඒ නිසා එයාට බාරගන්න තිබුණු රජකම එයා කවුරුත් නොහිතපු විදිහට ඉලිට බාර දුන්නා. ඊට පස්සේ ඉෆිගේ අම්මට ගොඩක් තරහා ගියා.

එයා ඉරිට හොදටම බැන්නා. ඒත් කවුරුත් නොහිතපු විදිහට එයාලාගේ රජතුමා එතනට අවා.එතන උත්සවයේ හිටිය සියළු දෙනා පුදුම වුණා. ඉලි තාත්තාව දැකලා එයා ගාවට දුවගෙන ගිහින් එයාව වැලදගත්තා. ඉලිට ගොඩක් සතුටුයි තාත්තාව දැක්කට පස්සේ තාත්තටත් සතුටුයි ඉලිව දැක්කට පස්සේ.ඒත් ඉරිගේ අම්මට මේ වන කිසි දෙයක් තේරුම් ගන්න බැරි වුනා. ඊට පස්සේ රජතුමා හැමදේම එයාලාට කිව්වා. මම යුද්ධයකට ගියේ නෑ එතකොට මැරුණා කියලා එව්ව පණිවිඩයත් බොරු මම එහෙම කරේ මම නැති දවසක මගේ දුවව ඔයාලා

කොහොම බලාගනීද කියලා බලන්න. ඒත් මට දැන් හිතාගන්න පුළුවන් මම දන්නවා මෙතන වුනු සියළු දෙයක්ම. ඒ නිසා මම තිරණය කරා ඉලිවයි ඉෆිවයි රාජධානියේම තබා ගෙන ඔයාව මෙම රාජධානියෙන් පිටුවහල් කරනවා. ඉෆිගේ අම්මව රාජධානියෙන් පිටුවහල් කළා. දැන් මෙම රාජධානියේ රජකම ඔයාල දෙන්නටයි කියලා. ඊට පස්සේ මෙයාලා සතුටෙන් ජිවත් වුනා.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි.

ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය. තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි.

පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි. විද්‍යුහල්පතිනිය, මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරිය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

**සෙනෙවිරත්න මහලේකම්** (ව්‍යාපෘති නිර්මාතෘ)